# හේතු සහ ආනිශංස ඇතුළත් සමකාලීන වහල් භාවයේ සියලු ආකාරයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු

ශ්‍රී ලංකා සංචාරයඃ 2021 නොවැම්බර් 26 සිට දෙසැම්බර් 03 දක්වා

මෙහෙවර අවසානයේ ප්‍රකාශය.

ජනමාධ්‍ය සාමාජිකයෙනි, ආදරණීය සහභාගිවන්නෙනි,

මා අද ඔබ අමතන්නේ 2021 නොවැම්බර් 26 සිට දෙසැම්බර් 03 දක්වා වූ ශ්‍රී ලංකාවේ මගේ නිල සංචාරය නිම කරමිනි. මෙම සංචාරය සිදු කෙළේ ශ්‍රී ලංකාණ්ඩුවේ ආරාධනය අනුවය.

මගේ දූත මෙහෙයේ අරමුණ වූයේ ඇඟලුම් කර්මාන්තය, තේ වතු සහ ගෘහස්ත වැඩ ඇතුළත් ආර්ථිකයේ නොයෙකුත් අංශවල ශ්‍රම තත්වය පිළිබඳව තක්සේරු කිරීමට ය. මම අදාල නීති සහ ප්‍රතිපත්ති කෙතරම් දුරට ක්‍රියාත්මක කර ඇත් ද යන්න සහ ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන් ඇතුළුව යහපත් වැඩ ලබා ගැනීමට පද්ධතිගතව කිසියම් බාධා පවතින්නේද යන්න පරීක්ෂා කිරීමට ද අදහස් කෙළෙමි.

පහත සඳහන් ප්‍රකාශයෙන් මගේ සංචාරය තුළදී රැස්කර ගත් තොරතුරු පදනම් වූ මගේ මූලික සොයා ගැනීම් කෙටියෙන් දක්වනු ඇත. මගේ අවසන් වාර්තාව 2022 සැප්තැම්බර් මස එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් මණ්ඩලයට ඉදිරිපත් කරනු ඇත.

සංචාරයට ආරාධනය කිරීම පිළිබඳවත් මට සහ මගේ නියෝජිත කණ්ඩායමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුවෙන් දක්වන ලද සත්කාරය පිළිබඳවත් කෘතඥතාවය පිරි නමනු කැමැත්තෙමි. මා හමුවීමට කාලය වෙන් කර ගත් ජාතික මට්ටමේ ආණ්ඩුවේ බලධාරීන්ගේ නියෝජිතයන්ට මෙන්ම සිවිල් සමාජ සංවිධාන, වෘත්තීය සමිති, මානව අයිතිවාසිකම් ආරක්ෂකයන්, ශ්‍රම සූරාකෑමේ වින්දිතයන්, අභ්‍යන්තර සංක්‍රමිකයන් සහ ආපසු පැමිණි සංක්‍රමික සේවකයන්, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසමට සහ එක්සත් ජාතීන්ගේ ආයතනවල සාකච්ඡාකරුවන්ටත් කෘතඥතාවය පිරි නමමි. මා සමග සාකච්ඡා කිරීමේ දී පාර්ශ්වකරුවන් දැක් වූ විවෘත භාවය මම අගය කරමි.

එමෙන්ම විදේශ කටයුතු අමාත්‍යාංශය මගේ සංචාරය ගැන දැක් වූ අවධානයටත් මට ලබා දුන් සහායට සහ සහයෝගයටත් මම කෘතඥවෙමි.

පසුගිය දින පහ තුළ මම මහනුවර දිස්ත්‍රික්කයේ නොයෙකුත් තේ වතු, කටුනායක නිදහස් වෙළඳ කලාපයේ සහ කොළඹ ඇඟලුම් කම්හල් නැරඹීමට ගිය අතර නොයෙකුත් පළාත්වල සේවකයන් සමග දුරස්ථ රැස්වීම් පැවැත් වූයෙමි.

**<u>සාධනීය ලක්ෂණ</u>**

මගේ මූලික සොයා ගැනිම්වලට අනුකූලව, වහල් භාවයේ සමකාලින ආකාරයන්ට ආමන්ත්‍රණය කිරීමට ආණ්ඩුව විසින් ගෙන ඇති සාධනීය පියවර ඉස්මතු කිරීමෙන් ආරම්භ කිරීමට කැමැත්තෙමි.

ගවේෂක රටක් ( Pathfinder Country ) වශයෙන් සන්ධාන 8.7ට ශ්‍රී ලංකාව එක්වීමෙන් තිරසාර සංවර්ධන අරමුණුවල 8.7 ඉලක්කය සපුරා ගැනීමට ඇති කැපවීම පැහැදිලි කරයි. තිරසාර සංවර්ධන අරමුණු රාජ්‍යයන්ගෙන් මෙසේ ඉල්ලා සිටීඃ

'' බලහත්කාරයෙන් ළමයින් සේවයේ යෙදවීම, නූතන වහල් සේවය සහ මිනිස් ජාවාරම තුරන් කිරීමට වහාම සහ පලදායි පියවර ගැනීම සහ ළමා සොල්දාදුවන් බඳවා ගැනීම සහ යොදා ගැනීම ඇතුළත් ළමා

ශ්‍රමයේ නරකම ආකාරයන් කහනම් කිරීම සහ තුරන් කිරීම, සුරක්ෂිත කිරීම සහ 2025 වන විට ළමා ශ්‍රමයේ සියලු ආකාරයන් අවසන් කිරීම.''

මේ සම්බන්ධයෙන් අත්කර ගෙන ඇති සැලකිය යුතු ජයග්‍රහණයක් වන්නේ 2013 දී රත්නපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කර ඇති ළමා ශ්‍රමයෙන් නිදහස් කලාපයක් පිළිබඳ නියමු ව්‍යාපාතියයි. වාර්තාවන ආකාරයට මෙම දිස්ත්‍රික්කය තෝරා ගෙන ඇත්තේ එහි ආර්ථිකයේ ව්‍යුහය ළමා ශ්‍රමය වැඩියෙන් යොදා ගන්නේයැයි පැවසෙන නිසා ය. ළමා ශ්‍රමයේ මූලික හේතු පිළිබඳව කරන ලද ගැඹුරු විශ්ලේෂණයකින් පසුව එම දිස්ත්‍රික්කය 'පූර්ණ ළමා සංවර්ධනය පිළිබඳ සැලැස්මක් සංවර්ධනය කර එම දිස්ත්‍රික්කයේ 'ආරක්ෂිත ළමයින්' සේ සැලකේ. ළමයින් යොදා ගන්න ව්‍යාපාරයන්ට අපරාධ ක්‍රියා පටිපාටි ආරම්භ කිරීමට පෙර ළමා ශ්‍රමිකයන් නිදහස් කිරීමට පොදු සහන කාලයක් ලබා දෙන ලදී. ආණ්ඩුව සිවිල් සමාජ සංවිධාන සමග එක්ව දෙමාපියන්, ප්‍රජා නායකයන්, ගුරුවරුන්, සෞඛ්‍ය සහ සමාජ සේවකයන්, වෘත්තීය සමිති සේව්‍යයන් වැනි මූලික පාර්ශ්වකරුවන් සමග ළමා ශ්‍රමය පිළිබඳ දැනුවත් භාවය නගා සිටුවීමට සහ වැළැක්වීමට රැස්වීම් ගණනාවක් පවත්වන ලදී. වැඩි දුරටත් ආණ්ඩුව පාසල්වල අවදානමක් ඇති ළමයින් හඳුනා ගැනීම සඳහා පෙර අනතුරු හැඟවීමේ ක්‍රමයක් ස්ථාපිත කරන ලදී. මෙම ප්‍රයත්නයන්ට ස්තුති වන්නට අදාල බලධාරීන්ගෙන් ලැබුණු සංඛ්‍යා ලේඛන අතුව මෙම දිස්ත්‍රික්කය 2018 වන විට ළමා ශ්‍රමය 107,000 සිට 43,000 දක්වා සියයට 60කින් අඩු කිරීමට සමත්ව ඇත.

ළමා ශ්‍රමය ආමන්ත්‍රණය කිරීමට ආණ්ඩුව විසින් වෙනත් පියවර ද ගෙන ඇත. නිදසුනක් වශයෙන් කාන්තාවන්, තරුණ පුද්ගලයන් සහ ළමයින් සේවයේ යෙදවීමේ පනත, සාප්පු සහ කාර්යාල පනත, අවම වැටුප් ( ඉන්දියානු ශ්‍රමිකයන්) ආඥාපනත, කර්මාන්ත ශාලා ආඥාපනතට ගෙන ලද ව්‍යවස්ථා සංශෝධන මගින් සේවයේ යෙදවීමේ අවම වයස 14 සිට 16 දක්වා ඉහළ නංවා ඇත. මෙය අනිවාර්ය අධ්‍යාපන වයස අවුරුදු 16 සමග ගැලපේ. වයස 18ට වඩා අඩු ළමයින් සේවයේ යෙදවීම තහනම් කරන ලද අනතුරුදායක වැඩ ලැයිස්තුව (1956 කාන්තාවන්, තරුණ පුද්ගලයන් සහ ළමයින් සේවයේ යෙදවීමේ පනත යටතේ ) සේවාවන් 71ක් දක්වා පුළුල් කෙරිණ. ඊට මානව අයිතිවාසිකම් දැක්මකින් බරපතළ කනස්සල්ලට හේතුවක් වූ කලින් නියාමනය නොකරන සේවයක් වශයෙන් හඳුනාගත් ගෘහස්ථ සේවය ද ඇතුළත් ය. ව්‍යතිරේකයක් නොමැතිව ළමා විවාහ තහනම් කිරීමේ ව්‍යවස්ථා සංශෝධනයක් ද දැනට සැකසෙමින් පවතින බව මට දැන ගන්නට ලැබිණ.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුව ගෙන ඇති වෙනත් පියවරවලින් ද මා දිරිමත් විය. නිදසුනක් වශයෙන් ශ්‍රී ලංකාව බලහත්කාර සේවා සන්ධානයේ අංක 29 මූල පත්‍රය අපරානුමත කළ ආසියානු රටවල් කීපයෙන් එකක්වීමෙන් බලහත්කාර සේවය ආමන්ත්‍රණය කිරීමට සහ වින්දිතයන් ආරක්ෂා කිරීමට ඇති කැපවීම පැහැදිලිවම පෙන්නුම් කරයි. එමෙන්ම ආණ්ඩුව අන්තර් ජාතිකව සංවිධානය වූ අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සන්ධානය සහ පුද්ගලයන් විශේෂයෙන්ම කාන්තාවන් සහ ළමයින් ජාවාරම් කිරීම වැළැක්වීම, මැඩපැවැත්වීම සහ දඬුවම් දීමේ මූල පත්‍රය වැනි අන්තර් ජාතික ප්‍රමිතීන්ට ගැලපෙන ආකාරයට මිනිස් ජාවාරම ඇතුළත් නොයෙකුත් වැරදිවලට දඬුවම් දීම සඳහා අපරාධ නීති සංග්‍රහය ද සංශෝධනය කර ඇත.

වෙනත් ව්‍යවස්ථා යෝජනා සම්බන්ධයෙන් කාන්තාවන් වැනි අවදානමක් ඇති පිරිස් ඉලක්ක කර ගත් ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වල හැසිරීම සහ ශ්‍රී ලාංකික සේවකයන් පිටරට යැවීම පහසු කරනු සඳහා සදාචාරමය නොවූ සහ නිත්‍යානුකූල නොවන ආකාරයට හැසිරෙන බඳවා ගැනීමේ උප නියෝජිතයන් නියාමනය කිරීම සඳහා වූ නිති සම්පාදනය කිරීම ගැන ආණ්ඩුව සැලකිල්ල යොමු කරයි.

ලබා ගත හැකි සේවාවන් පිළිබඳව දැනුවත් කිරීමට සහ ආධාර ලබා දීමට ආණ්ඩුව විසින් ගම්බද ප්‍රදේශ ද ඇතුළත් වන සේ කම්කරු පරීක්ෂකයන්ගේ ජංගම ඒකක රටේ නොයෙකුත් ප්‍රදේශවලට හඳුන්වා දී ඇති බව මට දැනගැනීමට ලැබිණ.

අවසාන වශයෙන් ශ්‍රී ලංකාවේ පවතින ශක්තිමත් වෘත්තීය සමිතිවලින් මම දිරිමත් වූයෙමි. සමහර පසුබැම් සහ දේශපාලනීයකරණය වීමේ ප්‍රවනතා දක්නට ලැබුණ ද වෘත්තීය සමිති බොහොමයක් සේවක අයිතිවාසිකම් වෙනුවෙන් ප්‍රගාමීව සටන් කරති. ඒ ආකාරයෙන්ම ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ සංවිධාන වහල් භාවයේ සමකාලීන ආකාරයන් හි වින්දිතයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ දී වැදගත් භූමිකාවක් ඉටු කර ඇති අතර තවදුරටත් එසේ කරනු ඇත. මට මෙම සංචාරයේ දී වෘත්තීය සමිති, මානව අයිතිවාසිකම් ආරක්ෂකයන් සහ සිවිල් සමාජ සංවිධාන විශාල සංඛ්‍යාවක් හමු වීමටත් තොරතුරු සහ අදහස් හුවමාරු කර ගැනීමටත් හැකි විය.

## කනස්සල්ල යොමු වූ ක්ෂේත්‍ර

ශ්‍රී ලංකාණ්ඩුව විසින් මෙම පියවර ගෙන තිබුණ ද මගේ සංචාරය තුළ දී බරපතළ කනස්සල්ලට හේතු වූ කරුණු ද මතුවිය. තවමත් මෙම රටේ වහල් භාවයේ සමකාලීන ආකාරයන් පවතින බව පැහැදිලි අතර ඒවා විශේෂයෙන්ම ළමයින්, කාන්තාවන්, වාර්ගික, භාෂා සහ ආගමික සුළුතරය මෙන්ම වයස්ගත පුද්ගලයන් ඇතුළත් අවදානම් සහිත තත්වයේ සිටින්නන්ට බලපායි. 8.7 සන්ධානයට අයත් ගවේෂක රටක් වශයෙන් ආණ්ඩුව 2030 වන විට මෙම භාවිතා අවසන් කිරීමේ තම ප්‍රයත්න තීරණාත්මකව උත්සන්න කළ යුතුය.

### ළමයින්

මගේ සංචාරයේ දී ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය තවමත් පවතින බව දැන ගැනීමට ලැබිණ. ළමා ජන සංඛ්‍යාවෙන් සියයට 1ක් තවමත් කිසියම් ආකාරයක වැඩවල නිරත වන බවට ගණන් බලා ඇති අතර ඒ බොහොමයක් අනතුරුදායක සේ සැලකෙන ඒවා ය. ගැහැනු ළමයින් සහ පිරිමි ළමයින් ගෘහස්ථ අංශයේත්, සත්කාරයේත්, පවිත්‍රතා අංශයේත් පොදු සේවා කර්මාන්තයේත් වැඩ කරති. වෙනත් අය සංචාරක අංශයේ ලිංගික සූරා කෑමට ලක් වෙති.

ළමා ශ්‍රමය වාර්ගික සුළුතරය ( එනම් මලයාහ සහ ශ්‍රී ලාංකික දෙමළ) වෙසෙන දුප්පත් ග්‍රාමීය ප්‍රදේශවල තියුණු ලෙස පවතී. එම ප්‍රදේශවල සමහර ළමයින්ට පාසල් හැර ගොස් තම පවුල්වලට සහාය වීමට බලකෙරේ.

සෘජුවම ලැබුණු සමහර තොරතුරු අනුව කොවිඩ්-19න් තත්වය වඩාත් උග්‍ර කරවීය. ජාතිකව රට වසා තිබීමේ ප්‍රතිඵලයක් වශයෙන් මාස 18ක් තිස්සේ පාසල් වසා තැබීමට සිදු වී පාසල් හැර යෑම වැඩි විය. රටේ නොයෙකුත් ප්‍රදේශවල විශේෂයෙන්ම ළමයින්ට අන්තර්ජාල පහසුකම්, විදුලි බලය හෝ උපකරණ නොමැතිවීමෙන් මාර්ගගත අධ්‍යාපනයට පිවිසිය නොහැකි නිසා හෝ වැඩිහිටියන්ට/දෙමාපියන්ට ආදායම නැතිව ගිය අවස්ථාවල සහ ඒ වෙනුවට ඔවුන්ගේ දරුවන් වැඩට යැවීමට සිදු වූ අවස්ථා පෙන්නුම් කරන සිත් කා වදින වාර්තා ද අප වෙත ලැබිණ. වැඩි දුරටත් ළමා ශ්‍රමයෙන් නිදහස් කලාපයක් පිහිටුවීම වැදගත් මුලපිරීමක් වුවත් එය විශේෂිත දිස්ත්‍රික්කයකට සීමාව පවතින්නේ ද යන්න සහ රත්නපුර දිස්ත්‍රික්කයේ වත්මන් පරිපාලනය ළමා ශ්‍රමයෙන් නිදහස් කලාප ආදර්ශය ගැන දැනුවත්ව, අධීක්ෂණය සහ ක්‍රියාත්මක කරන්නේ ද යන්න පැහැදිලි නැත. එමෙන්ම ළමා ශ්‍රමයෙන් නිදහස් කලාප රටේ සෙසු ප්‍රදේශවලට ද ව්‍යාප්ත කළ යුතුව පවතින අතර එසේ නොමැතිවීමෙන් ආරක්ෂාවේ අවදානම් භාවයේ කැපී පෙනෙන හිඩැස් ඇති වේ. මෙම ළමා ශ්‍රමයෙන් නිදහස් කලාප රටේ සෙසු ප්‍රදේශවලට ද ව්‍යාප්ත කිරීමට අදහස් කරන බව ආණ්ඩුව පවසන අතර එය සාර්ථකව ක්‍රියාත්මක කළ හොත් එය සාධනීය පියවරක් විය හැකිය.

වැඩි දුරටත් ග්‍රාමීය ප්‍රදේශවල මූලික වශයෙන් කොන් කරන ලද කාන්තාවන් ඉලක්ක කර ගත් ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රමවල ප්‍රතිඵලයක් වශයෙන් ණය ආපසු ගෙවීමට නොහැකි වීමෙන් වයස 16ට අඩු ළමයින් වැඩට යොදවන බවද දැන ගැනීමට ලැබිණ.

මෙම රටේ ළමා විවාහ පිළිබඳ සිද්ධීන් ද මට දැන ගන්නට ලැබිණ. විවාහ වීමේ සාමාන්‍ය වයස, නීතිය යටතේ 18 වන බැවින් එවැනි විවාහ සාමාන්‍යයෙන් විධිමත්ව ලියා පදිංචි කරන්නේ නැත. ළමා විවාහ විශේෂයෙන් බලපාන්නේ ගැහැනු ළමයින්ට ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් පාසල හැර යන අතර බාල වියේදීම ගැබ් ගැනීමෙන් ස්ත්‍රී පුරුෂ සමාජ භාවීය අසමානතාවය දිගටම පැවතීම සහ සූරා කෑමට සහ අපහරණයට ලක්වීමේ අනතුර වඩාත් වැඩි කරවයි. තවත් සමහර අවස්ථාවල බාල වයසේදීම ගැබ් ගැනීමෙන් පසුව පාසල් යෑම අතහැර සහකරුවා සමග ජීවත් වන නිසා බාල වියේ සිටම ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍යය ලබා ගැනීමත් විශේෂයෙන්ම ග්‍රාමීය සහ වතු කරයේ යෞවනයන්ට සහාය සේවා ලබා ගැනීමත් සහතික කිරීමේ වැදගත්කම ඉස්මතු කරයි.

ඉහත නිරීක්ෂණවලින් 2025 දී සියලු ආකාරයේ ළමා ශ්‍රමය තුරන් කිරීමේ අවශ්‍යතාවය සහශ්‍රක සංවර්ධන අරමුණු ඉලක්ක 8.7 යටතේ දැක්වෙන නිසා ශ්‍රී ලංකාව ළමා ශ්‍රමය තුරන් කිරීමේ ප්‍රයත්නය වඩාත් කඩිනම් කළ යුතුය. ශ්‍රී ලංකාව ගවේෂක රටක් වශයෙන් වහල් භාවයේ සමකාලීන ආකාරයක් සේ සැලකෙන ළමා ශ්‍රමයේ නරකම ආකාරයන් ලබන වසරේ දී, 2022 දී අවසන් කිරීමට කැපව ඇති නිසා මේ සම්බන්ධයෙන් වඩාත් අභියෝගාත්මක ඉලක්කයක් නියම කර ගෙන ඇත.

## කාන්තාවන්

ශ්‍රී ලංකාවේ කාන්තාවන් සහ ගැහැනු ළමයින් වහල් භාවයේ සමකාලීන ආකාරයන්ගෙන් අසමානුපාතිකව පීඩාවට ලක් වෙන බව මම දුටුවෙමි. එය ස්ත්‍රී පුරුෂ සමාජ භාවීය අසමානතාවය, පීතෘමූලික ආකල්ප සහ වෙනස් කොට සැලකීමේ අන්තර් ඡේදනීය ආකාරයන්ගෙන් සැලකිය යුතු මට්ටමකින් සමීපව අන්තර් සම්බන්ධයක්ව පවතී. වෙහෙසකර වැඩ කිරීමේ තත්වයන් ලක්ෂණ කොට ගත් වැවිලි අංශය, ගෘහස්ථ වැඩ සහ ඇඟලුම් අංශය වැනි සමහර අංශවල වැඩියෙන්ම සිටින්නේ කාන්තාවන් නිසා ඔවුන් සූරා කෑමට සහ අපහරණයට ලක්වීමේ අවදානම වැඩි කරවයි. වතු අංශයේ කාන්තාවන්ට තේ දළු කැඩීමෙන් අවම වැටුප උපයා ගැනීමට පිරිමින් මෙන් දෙගුණයක කාලයක් වැඩ කළ යුතුය. දෛනික වැටුප වන රුපියල් 1000 උපයා ගැනීමට වැවිලි/වතු සමාගම් කළමනාකාරිත්වය විසින් අදාල වත්ත අනුව නියම කරන ලද ඉලක්කය වන තේ දළු කි.ග්‍රෑ. 18-20 අතර ප්‍රමාණයක් කැඩිය යුතුය. එම ඉලක්කය ලබා ගත නොහැකි වුවහොත් ඔවුන්ගේ වැටුප අඩු කෙරේ. ඒ ආකාරයටම ඇඟලුම් අංශයේ ඉලක්ක ඉහළ දැමීමෙන් සේවිකාවන්ට නිරන්තරයෙන්ම පීඩණයක් ගෙන දේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමහරු ඉලක්කය සපුරා ගත යුතු නිසා නාන කාමරයට පවා යන්නේ නැත. සූරා කෑමේ මෙවැනි අවස්ථා සේවකයන් මෙන්ම සාකච්ඡාවට එක් වූ විශාල සංඛ්‍යාවක් තහවුරු කළහ.

කාන්තාවන් සහ වෙනත් සාකච්ඡාකරුවන් මා සමග මතු කළ ප්‍රධාන දුක්ගැනවිලිවලින් එකක් වන්නේ ශ්‍රී ලංකාවේ වැඩිවන ජීවන වියදමට නොගැලපෙන අඩු වැටුප් ය. නිදසුනක් වශයෙන් ඇඟලුම් අංශයේ මාසික වැටුප වන ඇමරිකානු ඩොලර් 120-150 නීතියෙන් නියම කරන ලද අවම වැටුපට වඩා වැඩි වුවද පවුලේ අවම වියදම හෝ සපුරන්නේ නැත.

මා කලින් ද සඳහන් කළ ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රමය එක් ගෘහමූලිකයෙකු සමණක් සිටින නිවෙස්වල, විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල කාන්තාවන්ට බලපාන තවත් උග්‍ර ප්‍රශ්නයකි. ආදායම් ඉපැයීමේ අවස්ථා නැති ඒ බොහෝ දෙනෙක් තම පවුල්වලට සහ/හෝ ව්‍යාපාරයට ආධාර වනු සඳහා ලියා පදිංචි බැංකුවලින් ණයක් ලබා ගත නොහැකි නිසා වෙනත් මාර්ගවලින් ණය ලබා ගැනීම කෙරේ විශ්වාසය රඳවති. ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් ඔවුන් පහසු ගොදුරක් සේ ඉල්ලක්ක කර ගන්නා බවද පැවසේ. ඔවුන්ගේ පොලී අනුපාතය සතියකට 20-30% තරම් ඉතා ඉහළ ය. සමාගම අනුව ඊටත් වඩා වැඩි පොලී අනුපාත ද අය කෙරේ. නොයෙකුත් සමාගම් විසින් ඉදිරිපත් කරන ගිවිසුම් කාන්තාවන්ට නොතේරෙන භාෂාවකින් ( ඉංග්‍රීසි වැනි) ලියා ඇති බව ද සාකච්ඡාකරුවන් කීප දෙනෙක්ම පැවසූහ. එමනිසා ඔවුන් අත්සන් කරන්නේ බැඳීම් සහ ඇතිවිය හැකි ආනිසංශ ගැන පූර්ණ අවබෝධයක් නැතිව ය.

ණයවල ඉහළ පොලී අනුපාතය නිසා බොහෝ කාන්තාවෝ ණය උගුලට හසුවෙති. මෙම තත්වය නිසා පසුගිය කාලය තුළ කාන්තාවන් 200කට අධික සංඛ්‍යාවක් සිය දිවි නසා ගත් බව වාර්තාවේ. බලාපොරොත්තු කඩ වූ කාන්තාවන් බොහෝ දෙනකු ණය ආපසු ගෙවීම සඳහා සූරා කෑම සහ අපහරණය බහුලව පවතින ලිංගික වැඩ හෝ ගෘහස්ථ වැඩ වැනි වෙහෙසකර වැඩෙහි නිරත වන්නේයැයි සාකච්ඡාකරුවෝ කීප දෙනකුම මා දැනුවත් කළහ. බොහෝ විට ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් වලට සම්බන්ධ සේවකයන් ( මෑන් පවර්) බඳවා ගැනීමේ නියෝජිත ආයතන සමහර විට නිදහස් වෙළඳ කලාපයේ සහ වෙනත් තැන්වල වැඩ කිරීමට මෙම ණය බරින් පෙළෙන කාන්තාවන් රැගෙන එති. සති පතා මුදල් එකතු කරන ක්ෂුද්‍ර මූල්‍ය නියෝජිතයන් ණය ආපසු ගෙවීම ලිහිල් කිරීමට නිරන්තරයෙන්ම ලිංගික ආශ්වාදය ඉල්ලා සිටින බව ද දැන ගැනීමට ලැබිණ. එය පැහැදිලිවම ඔවුන්ගේ අසරණ භාවය නිසා කෙරෙන සූරා කෑමකි.

වැඩි දුරටත් ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් බොහොමයක් මැද පෙරදිග රටවල් ඇතුළුව විදෙස් රැකියා සඳහා සංක්‍රමණය වීම පහසු කරන බඳවා ගැනීමේ උප නියෝජිතයන්ට සම්බන්ධ බව පෙනේ. මෙම නියෝජිතයෝ ණය ආපසු ගෙවීමට දිරි ගැන්වීමේ ගෙවීම් ලබා දීමට ඉදිරිපත් වන අතර ඒ අදාල කාන්තාවන් විදෙස් රැකියා සඳහා සංක්‍රමණය වීමේ කොන්දේසිය යටතේ ය.

සූරා කෑමේ යෙදෙන ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් නියාමනය සහ අධීක්ෂණය සඳහා ආණ්ඩුව මෙතෙක් ඵලදායි සහ කාලීන පියවර කිසිත් ගෙන නැතිවීමෙන් මම බලවත් සේ කනස්සල්ලට පත්වෙමි. එහි ප්‍රතිඵලය වශයෙන් ඔවුහු සීමාවක් නොමැතිව ක්‍රියාත්මක වෙති.

ආරක්ෂක ආයතනවල සාමාජිකයන් ද ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වලට සම්බන්ධ අය විය හැකියැයි මට දැන ගැනීමට ලැබුණ අතර එමනිසා පොලීසියට කරන ලද පැමිණිලි ගැන කටයුතු නොකිරීමෙන් කාන්තාවන්ට යුක්තිය සහ ප්‍රතිකර්ම ලබා ගැනීමට ඇති අවස්ථා සීමා වේ. ජාතික මානව හිමිකම් කොමිසම වැනි වෙනත් ඒකක ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වල ක්‍රියාකාරිත්වයට අදාල මානව අයිතිවාසිකම් අපහරණ විමර්ශනය කිරීමට ප්‍රමාණවත්ව ප්‍රගාමී වන්නේ නැත. ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් නියාමනය කරනු සඳහා ක්‍රමයක් සකස් කිරීමට නීති සංශෝධනයක් ව්‍යවස්ථාදායකයට ඉදිරිපත් කර ඇතැයි ආණ්ඩුව මට දැනුම් දුන්නේය. එය තවත් ප්‍රමාද නොකරන මෙන් මම ඔවුන්ගෙන් ඉල්ලා සිටිමි.

ස්ත්‍රීපුරුෂ සමාජ භාවයට වැඩියෙන්ම ලක් වූ තවත් අංශයක් වන්නේ ගෘහස්ථ වැඩ ය. එහි අති මහත් සේවක බහුකරය වන්නේ කාන්තාවන් සහ ගැහැනු ළමයින් ය. එය ලෙඩ/වාර්ෂික නිවාඩු, අවම වැටුප සහ වෙනත් හිමිකම් වැනි සාමාන්‍ය අවශ්‍යතා අදාල නොවන්නා සේ පෙනෙන අඩුවෙන්ම නියාමනය වන කර්මාන්තයකි. ප්‍රමාණවත් ගෙවීමක් හෝ විවේකයක් නොමැති දුෂ්කර සේවා තත්වයන් ගැන සාකච්ඡාකරුවන් ගණනාවක් විසින් මා දැනුවත් කරන ලදී. හිමිකම් දීමනාවක් හැම විටම ලැබෙන්නේ නැත. කායික, වාචික සහ ලිංගික අපහරණ පිළිබඳ අවස්ථා පවා වාර්තා විය.

මගේ සංචාරයේ දී සියලු ස්ත්‍රී පුරුෂ සමාජ භාවීය අනන්‍යතාවයේ ලිංගික නැඹුරුවෙන් යුත් ලිංගික සේවකයන් වෙනස් කොට සැලකීමට සහ අපකීර්තියට ලක් කෙරෙන බවට මා දැනුවත් කෙරිණ. නීතිය බලාත්මක කරන නිලධාරීන් විසින් ද ඇතුලුව සූරා කෑමේ සහ අපහරණයවීමේ වැඩි අවදානමකට ඔවුහු ලක්වෙති. නීතිය බලාත්මක කිරීම සම්බන්ධයෙන් බලන විට ලිංගික සේවකයන් අත් අඩංගුවට ගැනීමට සහ නඩු පැවරීමට අසමානව ලක් වෙන අතර ලිංගික සේවකයන්ගෙන් විශාල මුදල් ප්‍රමාණයක් ලබා ගන්නා ත්‍රීරෝද රියැදුරන් සහ හෝටල් සේවකයන්ට නිසි ආකාරයට නඩු පැවරෙන්නේ හෝ දඬුවම් කෙරෙන්නේ නැත.

**වයස්ගත/ විශ්‍රාමික සේවකයන්**

වයස්ගත සහ/හෝ විශ්‍රාමිකයන් සේවා නියුක්තියට අදාලව ප්‍රශ්න ගණනාවකට මුහුණ දෙන බව සාකච්ඡාකරුවෝ වැඩි දෙනෙක් පැවසූහ. නිදසුනක් වශයෙන් තරුණ ජනතාව වතුවලින් පිටත සේවය

කිරීමේ ප්‍රවනතාවයක් පවතින නිසා වතු අංශයේ සේවා බලකායෙන් බහුතරය 50ට වැඩි අයයි. එහෙත් ඔවුන්ට ලෙඩ හෝ වැටුප් සහිත නිවාඩු මෙන්ම සෞඛ්‍ය රැකවරණයට සහ සමාජ ආරක්ෂාවට ප්‍රමාණවත් අවස්ථාවක් නොමැතිව දෛනිකව කායිකව අභියෝගාත්මක වැඩ කිරීමට සිදු වේ. සමාන අත්දැකීම් අනෙක් අංශවල ද නිරීක්ෂණය විය.

පළ කරන ලද තවත් බරපතළ කනස්සල්ලක් වූයේ සේවකයන්ට වයස අවුරුදු 60 සම්පූර්ණ වීමෙන් පසු ලබා ගත හැකියයි කියන සේවක භාරකාර අරමුදල, සේවක අර්ථ සාධක අරමුදල සහ පාරිතෝෂිකය ඇතුළත් විශ්‍රාම යෑමේ දී ලැබෙන අරමුදල් කාලීනව නොලැබීම ය. ( සේවා භාරකාර අරමුදල විශ්‍රාම යෑමට පෙර ද ලබා ගත හැකිය.) එමනිසා විශ්‍රාම ගිය සමහර පුද්ගලයන්ට ආපසු සේවයට පැමිණීමට සිදුව ඇත. රාජ්‍ය කළමනාකරණය යටතේ ඇති වැවිලි සමාගම් සමග මෙම ප්‍රශ්නය මතු කිරීමේ දී සේවක අර්ථ සාධක සහ සේවා භාරකාර අරමුදල් ගෙවීමේ විශාල පමාවක් පවතින බව පිළිගත් අතර නුදුරු කාලයේ දී මෙම තත්වය විසඳනු ඇතැයි මට සහතික විය. මෙය තවත් ප්‍රමාද නොකොට සොයා බලන මෙන් මම රජයෙන් ඉල්ලා සිටිමි.

**සංක්‍රමණික සේවකයන්**

කලින් සඳහන් කළ ආකාරයට මෙම සංචාරයේ දී අභ්‍යන්තර සංක්‍රමණික සේවා තත්වය සහ ආපසු පැමිණි සංක්‍රමණික සේවකයන්ගේ තත්වය තක්සේරු කෙළෙමි.

දැනට පවතින වැඩ කිරීමේ රාමුව අනුව රැකියා සඳහා විදෙස් රටවලට යෑමට අදහස් කරන සියලු පුද්ගලයන් විදෙස් සේවා නියුක්ති කාර්යංශයේ ලියා පදිංචි විය යුතුය. ඒ සඳහා රුපියල් 17500ක මුදලක් ගෙවිය යුතු අතර වාර්තාවන ආකාරයට ඉන් සියයට 10 රක්ෂණය සඳහා වන අතර සියයට 70ක් බඳවා ගැනීමේ නියෝජිතයාට ද සියයට 20ක් කාර්යංශයට ද හිමි වේ.

අදාල බලධාරීන් සඳහන් කරන ආකාරයට සේවකයන්ට පිටත්ව යෑමට පෙර ඔවුන් යන රටේ දී කිසියම් දුෂ්කරතාවයකට මුහුණ දීමට සිදු වුවහොත් ලබා ගත හැකි සමාජ සහ ආර්ථික ආධාර පිළිබඳව කෙටි හැඳින්වීමක්/ පුහුණුවක් මෙන්ම ආපසු ඔවුන් ශ්‍රී ලංකාවට පැමිණි පසු වැඩි දුරටත් ලබා ගත හැකි නැවත අන්තර්ග්‍රහණය කර ගැනීමේ වැඩ සටහන් ද ඇත.

කෙසේ වුවත් ආපසු රටට පැමිණි සංක්‍රමණික සේවකයන් මුණ ගැසීමේ දී පවතින ක්‍රමයේ හිඩැස් ගණනාවක් පවතින බවට දැනුවත් වූයෙමි. නොයෙකුත් විදෙස් රටවල ගෘහ සේවිකාවන් වශයෙන් වැඩ කළ සමහර කාන්තාවන්ගේ වැටුප් රඳවා ගැනීමේ සිට දිගු පැය ගණනක් වැඩ කිරීමට සිදුවීම සහ කායික සහ/හෝ ලිංගික අපහරණය වැනි වැඩ පොළේ සිදු වන අපහරණ සහ සූරා කෑමේ අවස්ථා ගැන මට දැන ගැනීමට ලැබිණ. මෙම අපහරණ ආමන්ත්‍රණය කිරීමේ මූලික වගකීම විදේශ ගත වූ රටවලට පැවරෙන නමුත් මගේ කනස්සල්ල වූයේ ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලවලින් සහ කොන්සියුලර් කාර්යාලවලින් ප්‍රමාණවත් සහායක් නොලැබීම ගැන ය. සියලුම නිලධාරීන් ප්‍රමාණවත්ව පුහුණු කර නැත. ආධාර පතා පැමිණි සංක්‍රමණික සේවකයන් ආපසු හරවා යැවීමේ අවස්ථා පිළිබඳ වාර්තා ද මට ලැබිණ. සමහර තානාපති කාර්යාලවල රැකවරණ ස්ථාන පිහිටුවා ඇති නමුත් ඒවා ප්‍රමාණවත්යැයි සලකන්නේ නැත.

කොවිඩ්-19 වසංගතය නිසා තත්වය වඩාත් උග්‍ර කරවීය. එම තත්වය නිසා විශාල සේවක සංඛ්‍යාවක් ප්‍රමාණවත් ආයතනික සහායක් නැතිව අතරමං වූහ.

වැඩි දුරටත් ශ්‍රම සංක්‍රමණය සඳහා පවතින පාලන ක්‍රමයේ පුළුල් ව්‍යුහාත්මක ගැටලු පවතී. විදෙස් සේවා නියුක්ති කාර්යංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන වශයෙන් සංයුක්ත වන්නේ වෘත්තීය සමිති හෝ සේවක නියෝජනයක් නැතිව රැකියා නියෝජිත ආයතනවලිනි. සේවකයන් ගෙවන ගාස්තුවලින් අති බහුතරය යොමු වන්නේ ඔවුන්ට ය. ඊට ප්‍රතිචාර වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සංශෝධනය කිරීමේ

ක්‍රියාවලියක යෙදී සිටින බව ආණ්ඩුව සඳහන් කරයි. මෙය හැකිතාක් ඉක්මණින් ක්‍රියාත්මක කරන මෙන් මම ඉල්ලා සිටිමි.

ශ්‍රී ලංකා විදෙස් සේවා කාර්යංශය 2013 දී හඳුන්වා දුන් පවුල් පසුබිම් වාර්තාව ගැන ද වචන කීපයක් කියනු කැමැත්තෙමි. එහි වයස අවුරුදු පහට වඩා අඩු ළමයින් සිටින ගෘහ සේවයේ යෙදීමට අදහස් කරන කාන්තාවන්ට විදෙස් රටක සේවයේ සඳහා සංක්‍රමණය වීම තහනම් කරන නියමයක් ද ඇතුළත් ය. මගේ සංචාරයේ දී මට දැන ගැනීමට ලැබුණු තොරතුරු අනුව මෙම නියමය සංක්‍රමණික සේවිකාවන් සහ ඔවුන්ගේ පවුල් කෙරේ මතභේදයට තුඩු දෙන බලපෑමක් ඇති කරවයි. වයස පහට වඩා අඩු ළමයින් සිටින කාන්තාවනට විධිමත් මාර්ගයෙන් සංක්‍රමණය වීමේ දී පනවා ඇති සීමාවන් නිසා විධිමත් නොවන මාර්ගවලින් සංක්‍රමණය වීමේ අනතුර වැඩි කරන අතර ඉන් සූරා කෑම සහ අපහරණය වඩාත් වැඩි කරවයි. මෙම නියමය ස්ත්‍රී පුරුෂ සමාජ භාවීය වෙනස් කොට සැලකීමක් සේ දකින නිසා එය සංශෝධනය විය යුතුය.

වැඩි දුරටත් රක්ෂණය සඳහා බොහෝ විට ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදනය කර නැති බව නොයෙකුත් පාර්ශ්වකරුවන්ගෙන් මට දැන ගැනීමට ලැබිණ. එමනිසා තුවාල සිදුවීමක දී හෝ අසනීප වීමේ දී සේවකයන්ට බොහෝ විට ප්‍රමාණවත් දීමනාවක් ලැබෙන්නේ නැත.

වැඩි දුරටත් ආපසු පැමිණි සංක්‍රමණික සේවකයන් සඳහා වූ ප්‍රති අන්තර්ග්‍රහණය කිරීමේ වැඩ සටහන්වලින් ප්‍රමාණවත් සමාජ ආර්ථික ආධාර නොලැබෙන බව ද මට දැන ගැනීමට ලැබිණ. එය අදාල ආණ්ඩුවේ ආයතනවලින් ලැබුණ තොරතුරුවලට පරස්පරය. මෙය විශේෂයෙන්ම අභියෝගාත්මක තත්වයක් වන්නේ කොවිඩ්-19 වසංගත තත්වය යටතේ සංක්‍රමණික සේවකයන් ආපසු ශ්‍රී ලංකාවට පැමිණි විට ඔවුන්ට සහ ඔවුන්ගේ පවුල්වලට යැපුම් මාර්ගයක් නොමැතිවීමෙනි.

ආපසු පැමිණි විට ප්‍රමාණවත් ආධාරයක් නොමැතිවීමෙන් ආපසු පැමිණෙන සංක්‍රමණිකයන්ට නැවතත් සංක්‍රමණය වීමට, ලිංගික වැඩවල යෙදීමට හෝ ගෘහ සේවය හෝ ඇඟලුම් කර්මාන්තය වැනි අඩු වැටුප් ගෙවන අංශවල රැකියා සොයා යෑමට බලකෙරේ.

අවසාන වශයෙන් කාර්යංශයේ පවතින නිලධාරිවාදය සහ ඉහළ ගාස්තුව නිසා බොහෝ සේවකයන් එහි ලියා පදිංචි නොවන බව ද මට දැන ගැනීමට ලැබිණ. විකල්පයක් වශයෙන් බොහෝ දෙනා ආණ්ඩුවෙන් නිසි පරිදි නියාමනය නොවන උප-නියෝජිතයන් යොදා ගනිති. වාර්තා වන ආකාරයට මෙම නියෝජිතයෝ නිරන්තරයෙන්ම සාවද්‍ය තොරතුරු ලබා දෙන අතර මිනිස් ජාවාරමේ යෙදෙමින් සංක්‍රමණික සේවිකාවන්ගෙන් ලිංගික ඇසුර ද ඉල්ලා සිටිති. දැනට උප-නියෝජිතයන් යොදා ගැනීම ආමන්ත්‍රණය කිරීමට ව්‍යවස්ථාමය රාමුවක් නැති නිසා මෙම අවශ්‍යතාවය හැකිතාක් ඉක්මණින් නිවැරදි කළ යුතුය.

**වාර්ගික සුළුතරය**

ශ්‍රී ලංකාවේ වහල් භාවයේ සමකාලීන ආකාරයන් තුළ වාර්ගික පැතිමානයක් පවතින බව මට දැක ගැනීමට හැකි විය. වසර 200කට පෙර වතු අංශයේ වැඩ කිරීමට ඉන්දියාවෙන් ගෙන එන ලද මලයාහ දෙමළ ජන කොටසට තම සම්භවය පදනම්ව වෙනස් කොට සැලකීමේ විවිධ ආකාරයන්ට දිගටම මුහුණ දීමට සිදුව ඇත.

දාස භාවයේ අවස්ථාවන්ට සහ සූරාකෑමේ සහ අපහරණයේ වෙනත් ආකාරයන්ට මෙය හේතුවී ඇත. නිදසුනක් වශයෙන් වතු අංශයේ මලයාහ දෙමළ ජන කොටස මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් වන්නේ ඉඩම් හිමි කර ගැනීමට ඇති නොහැකියාව යි. එම නිසා ඔවුන්ට යටත් විජිත සමයේ තනන ලද ඊනියා 'ලයින් නිවාස, වල ජීවත්වීමට සිදුවේ. මහනුවරට ගිය ගමනේ දී මම මෙම නිවාස බැලීමට ගිය අතර

ඒවායේ අවමන් සහගත ජීවන තත්වය ගැන බලවත් කනස්සල්ලට පත් වූයෙමි. අඩි 10X 12 වැනි කුඩා ඉඩ ප්‍රමාණයක පුද්ගලයන් 5-10ක් සාමාන්‍යයෙන් සිටින බව මට දැන ගන්නට ලැබිණ. මෙම ලයින් කාමර බොහොමයකට ජනේල හෝ නිසි ආකාරයේ කුස්සි නැත. වැඩි දුරටත් වැසිකිළි ඇත්තේ සීමිත සංඛ්‍යාවකි. එහි ප්‍රතිඵලයක් වශයෙන් පවුල් කීපයකට එකම වැසිකිළියක් යොදා ගැනීමට සිදු වේ. නළ ජල සැපයුමක් නැති අතර සමහර නිවාසවලට විදුලිය ද නැත. සමහර විකල්ප නිවාස තනා ඇති බව මට දැන ගැනීමට හැකිවිය. ( නිදසුනක් වශයෙන් ඉන්දියානු ආණ්ඩුවේ සහයෝගිතාවයෙන් තනා ඇති නිවාස) එහෙත් අද දක්වාම පවතින අමානුෂික සහ අවමන් සහගත ජීවන තත්වය ගැන මම කම්පාවට පත් වූයෙමි.

තවත් ගැටලුවක් වන්නේ භාෂාව යි. සිංහල සහ දෙමළ ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා වුවද දෙමළ සේවකයන්ට බොහෝ විට අපහරණය වැනි සිද්ධීන් පොලීසිය වැනි බලධාරීන්ට වාර්තා කිරීමට නොහැකි වන්නේ පොලිස් නිලධාරීන් බොහෝ දෙනකු සිංහල පමණක් කතා කරන නිසා සහ ඔවුන්ට පැමිණිල්ල සිංහල භාෂාවෙන් කිරීමට බල කිරීමෙනි. මෙය රටේ නොයෙකුත් ප්‍රදේශවලින් වාර්තා විය. බොහෝ සේවකයන්ට සමකාලීන වහල් භාවයේ ආකාරයන් ඇතුළත්ව තම අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම වෙනුවෙන් යුක්තිය සහ ප්‍රතිකර්ම ලබා ගැනීමේ මාර්ගවලට පිවිසීම මෙන්ම ඔවුන්ට තේරෙන භාෂාවකින් ප්‍රමාණවත් දැනුමක් ලබා ගත නොහැකිය. ඉන් වින්දිතයන්ට සූරා කෑමේ සහ අපරණ අවස්ථා වාර්තා කිරීම අධෛර්ය කරවන බව මට දැන ගැනීමට ලැබිණ.

ශ්‍රී ලංකාවේ තවමත් පවතින්නේයැයි වාර්තා වන කුලය පදනම් වෙනස්කොට සැලකීම පිළිබඳ ගැටලුවද ඉස්මතු කිරීමට කැමැත්තෙමි. උතුරු පළාතේ, නිදසුනක් වශයෙන් පීඩිත කුලවලට අයත් පුද්ගලයන්ට කෘෂිකාර්මික ව්‍යාපාරයක් පටන් ගැනීමට සුදුසු ඉඩමක් ලබා ගත නොහැකිය. ජලය සහ වාරිජලය ලබා ගැනීම සීමිත ය. රජයේ නිලධාරීන් ඇතුළුව ප්‍රධාන කුලවලට අයත් පුද්ගලයන් විසින් අපහාසාත්මක භාෂාව යොදා ගැනීම ඇතුළත් වැඩපොළේ දී හිරිහැර කිරීමේ අවස්ථා මට වාර්තා විය. පීඩිත කුලවල අයට උසස්වීමේ අවස්ථා බෙහෙවින් අඩු යැයි පැවසේ. පීඩිත කුලවලට අයත් පුද්ගලයන්ට සහ ප්‍රජාවන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය යොදා ගැනීමේ අවස්ථා ද නිතර සිදු වේ. කුලය පිළිබඳ ප්‍රශ්නය නිහඬ කර ඇති බවත් මෙම ප්‍රශ්නය ප්‍රමාණවත්ව ආමන්ත්‍රණය කිරීමට බලධාරීන් සහ ප්‍රජාවන් තුළ අකමැත්තක් පවතින බවත් මට දැන ගැනීමට ලැබිණ. පීඩිත ජනයා කෙරේ වෙනස් කොට සැලකීමේ සහ අපහරණ අවස්ථා පීඩිත පුද්ගලයන්ට යහපත් වැඩ ලබා ගැනීමේ අවස්ථා සීමා කරවන නිසා මේ පිළිබඳව මගේ අවධානය යොමු විය. ඉන් වහල් භාවයේ සමකාලීන ආකාරයන් වැඩිවීමේ අවදානමක් ද පවතී.

**හමුදාකරණය සහ සිවිල් අවකාශය පටුවීම**

විවිධ පාර්ශ්වයන් සමග ඇති වූ මගේ සම්බන්ධතාවයන් හිදී සේවකයන් බියට පත්කිරීමේ සංස්කෘතියක් සහ දැඩි පාලනයක් ඇති කරන අවස්ථා තේ වතු සහ ඇඟලුම් කර්මාන්ත වැනි පුද්ගලික ව්‍යාපාරවලට විශ්‍රාමික හමුදා නිලධාරීන් නිතර නිතර බඳවා ගැනීම පිළිබඳ වාර්තා ද මට ලැබිණ. එමෙන්ම සිවිල් සමාජයේ නියෝජිතයන්, මානව අයිතිවාසිකම් ආරක්ෂකයන් සහ වෘත්තීය සමිති සාමාජිකයන්ට නිරන්තරයෙන්ම හිරිහැර කිරීම සහ තර්ජනය කිරීම සහ රැස්වීමේ නිදහස සීමා කිරීමට කොවිඩ් වලට අදාල සීමා කිරීම් යොදා ගැනීම හරහා සිවිල් සමාජ අවකාශය හැකිළ වීම ද මට දැන ගැනීමට ලැබිණ. මෙය රටේ උද්‍යෝගිමත් සිවිල් සමාජයක් පැවතීමට සහ වෘත්තීය සමිති සම්බන්ධතාවය සීමා කරවන නිසා මගේ අවධානය යොමු වූ කරුණකි.

**අතිරේක නිරීක්ෂණ**

- පොදුවේ කතා කරන විට රටේ වහල් භාවයේ සමකාලීන ආකාරයන් සහ අදාල භාවිතාවන් ගැන යාවත්කාලීන සහ වෙන් කර දක්වන දත්තවල අඩුවක් පවතී.
- තවදුරටත් තක්සේරුවට ලක් වූ අංශවල එම ස්ථානයන්හි නිති පතා කම්කරු පරීක්ෂාවන් සිදු කරන්නේ නැත. නැතිනම් එම පරීක්ෂණවල බලපෑමක් නැත. එයට හේතු වන්නේ සමහර අවස්ථාවල පරීක්ෂකයන් සහ ව්‍යාපාරිකයන් අතර පවතින්නේයැයි කියන සම්බන්ධතාවයයි.
- ඉහතින් සඳහන් කළ ආකාරයට මතු කරන ලද බලවත් කනස්සල්ලට කරුණක් වන්නේ උද්ධමනය සැලකිල්ලට නොගන්නා අඩු වැටුප් ය. 2021 අගෝස්තු මාසයේ දී අවම වැටුප රු. 16,000 දක්වා වැඩි කළ නමුත් මා සමග සාකච්ඡා කළ බොහෝ දෙනක් තම පවුල් නඩත්තු කිරීමට එය ප්‍රමාණවත් නැතැයි පැවසූහ. බොහෝවිට ගෘහ සේවිකාවන්ට දිනකට ලැබෙන්නේ රු. 500ක් වැනි සුළු මුදලකි. ඉන් මෙම අංශයේ කාන්තාවන් සහ ගැහැනු ළමයින් සූරා කෑමට ලක් වෙන ඉහළ මට්ටම පෙන්නුම් කරයි.
- වතු අංශයේ සමහර කොටස්, ගෘහ සේවය සහ වෙනත් ආකාරයේ රැකියා ආර්ථිකයේ නොවිධිමත් අංශයේ පවතින නිසා ශ්‍රම සහ ලිංගික සූරා කෑමට ලක්වීමට ඉඩ ඇත. මෙම රැකියාවන්ට ගිවිසුම් අත්සන් කිරීමක් සිදු නොවන නිසා නොවිධිමත් අංශයේ සේවකයන්ට ලෙඩ/වාර්ෂික නිවාඩු වැනි ප්‍රතිලාභ ලබා ගත නොහැකිය.
- මගේ සංචාරයේ දී ව්‍යාපාර සහ මානව අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශ මූලධර්මවලට ගැලපෙන ආකාරයට, ව්‍යාපාර විසින් නිසි උනන්දුවක් දැක්වීමට ආණ්ඩුව විසින් ක්‍රියාත්මකව ප්‍රවර්ධනය කරන ප්‍රමාණය මට තහවුරු කළ නොහැකි විය.
- ශ්‍රම සූරා කෑමේ වින්දිතයන්ට බොහෝ විට මේ සම්බන්ධයෙන් ප්‍රමාණවත් තොරතුරු ලබා ගැනීමට නොහැකිවීම නිසා යුක්තිය සහ ප්‍රතිකර්ම ලබා ගැනීමේ විවිධ සීමාවන් පවතී. ඉන් සියලු ජනතාවට නිවැරදි තොරතුරු ලබා දීමේ ආණ්ඩුවේ ප්‍රයත්නයේ සාර්ථක භාවය ගැන බරපතළ ප්‍රශ්න මතු කරයි. එමනිසා ගොනු කරන පැමිණිලි සංඛ්‍යාව සීමිත විය හැකිය. නිදසුනක් වශයෙන් 1999 සහ 2019 අතර කාලයේ 1999 කම්කරු ආරාවුල් පනත යටතේ අසාධාරණ ශ්‍රම භාවිතා පිළිබඳව අධිකාරියට ඉදිරිපත් කර ඇත්තේ පැමිණිලි 16ක් පමණි. ප්‍රශ්නය ලෙස පෙනී යන්නේ සාක්ෂි ලබා දීම පිළිබඳව වින්දිතයා මත අධික බරක් පැටවීම ය.

**මූලික නිර්දේශ**

රටේ වහල් භාවයේ සමකාලීන ආකාරයන් වැළැක්විය හැකි සහ ආමන්ත්‍රණය කළ හැති පහත සඳහන් පියවර ක්‍රියාත්මක කිරීම සැලකිල්ලට ගන්නා මෙන් මම ශ්‍රී ලංකාවේ ආණ්ඩුවෙන් ඉල්ලා සිටිමි.

- සාක්ෂි පදනම් ත්‍රිපාර්ශ්වීය ස්වාධීන යාන්ත්‍රණයක් හරහා දැනට යෙදෙන ජාතික අවම වැටුපේ උචිත භාවය තක්සේරු කොට උද්ධමනය සහ ඉහළ යන ජීවන වියදමට සරිලන ආකාරයට අවශ්‍ය ගැලපීම් සිදු කිරීම
- දැනට නොවිධිමත් ආර්ථිකය තුළ පවතින ගෘහස්ථ වැඩ සහ අනෙකුත් අංශ කම්කරු නීතිය යටතට ඇතුළත් කොට ඒවා විධිමත් කිරීම
- 2025 වන විට ළමා ශ්‍රමයේ නරකම ආකාරයන් අවසන් කිරීම
- ළමයින් පාසල් යෑමත් වෙනස් කොට සැලකීමක් නැතිව සියල්ලන්ට ගුණාත්මක අධ්‍යාපනයක් සමානව ලබා ගැනීම තහවුරු කිරීම. පවුල්වලට සියලුම ළමා ප්‍රතිලාභ ලබා දීම

- කාන්තාවන්, ළමයින් සහ වාර්ගික සුළුතරය ඇතුළත් සියලු දෙනාටම ලබා ගත හැකි වහල් භාවයේ සමකාලීන සියලු ආකාරයන් ඇතුළත් මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සඳහා දැනට පවතින පැමිණිලි කිරීමේ පද්ධති ශක්තිමත් කිරීම
- ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් පිළිබඳව විධිමත් සහ ස්වාධීන විමර්ශන පැවැත්වීම. හේතු යුක්ති කළ නොහැකි සහ අධික ණය කපා හැරීම සහ ඒවා පිළිබඳව පොලී සීමාවන් ඇතුළත්ව ඵලදායි පාලනයක් සහ අධීක්ෂණයක් හඳුන්වා දීම.
- ඉතිරුම් සහ ණය (සකසුරුවම්) සමිති, සමුපකාර බැංකු සහ ග්‍රාමීය සංවර්ධන බැංකු ( ප්‍රාදේශීය සංවර්ධන බැංකු) හරහා යොමු කරන සාධාරණ පොලියට ණය ලබා ගැනීම සහතික කිරීම
- ප්‍රමාණවත් සම්පත් වෙන් කිරීමෙන් කම්කරු පරීක්ෂණ ශක්තිමත් කිරීම සහ ශ්‍රමය සූරා කන පුද්ගලයන් වගවන තත්වයට පත් කෙරෙන ඵලදායී කම්කරු පරීක්ෂණ නිතිපතා පැවැත්වීම
- වහල් භාවයේ සමකාලීන ආකාරයන් කලින්ම හඳුනා ගැනීම වැඩි දියුණු කිරීමට රට පුරාම විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල කම්කරු පරික්ෂා අංශයේ ජංගම ඒකක යෙදවීම වඩාත් ශක්තිමත් කිරීම
- රැකියා සඳහා සංක්‍රමණයවීමට වඩාත් පාරදෘශ්‍ය සහ කාර්යක්ෂම භාවයෙන් යුත් සහ සේවකයන්ට මිත්‍රශීලී පද්ධතියක් ස්ථාපිත කිරීම
- සේවය සඳහා යන රටවල විය හැකි ශ්‍රම සූරාකෑමේ අනතුරු පිළිබඳ දැනුවත් භාවය වැඩි කිරීමට සහ (සේවයට යෑමට අදහස් කරන) සංක්‍රමණික සේවකයන්ට උපදේශන සේවා ලබා දීම සඳහා සංක්‍රමණික සේවකයන් සහ ඔවුන්ගේ පවුල් සඳහාම වෙන් වූ සියලු විස්තර ලබා ගත හැකි කාර්යාලයක් පිහිටුවීම. ආරක්ෂිත සංක්‍රමණය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම
- රැකියා සඳහා විදෙස් රටවලට යෑමට අදහස් කරන ශ්‍රී ලාංකික වින්දිතයන් බවට පත් කරන, බඳවා ගැනීමේ උප නියෝජිතයන් සඳහා වඩාත් දැඩි පාලනයක් හඳුන්වාදීම
- විදෙස්ගතව සිටින ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන් ඵලදායිව ආපසු ගෙන්වා ගැනීම සහ ප්‍රති අන්තර්ග්‍රහණය වැඩි දියුණු කිරීම
- බිය වැද්දීම, පලිගැනීම, තර්ජනය කිරීම සහ සෝදිසි කිරීමේ බියෙන් තොරව ප්‍රකාශ කිරීමේ, රැස්වීමේ සහ සංගම් පැවැත්වීමේ නිදහස සිවිල් සමාජ සංවිධාන, වෘත්තීය සමිති සහ වෙනත් මානව අයිතිවාසිකම් ආරක්ෂකයන් විසින් භුක්ති විඳිනු සඳහා සිවිල් අවකාශය සහතික කිරීම
- සේවකයන්, සිවිල් සමාජ සංවිධාන සහ වෘත්තීය සමිති තුළ බියවීමේ සංස්කෘතියක් නිර්මාණය කළ සේවා බලකාය හමුදාකරණය ආමන්ත්‍රණය කිරීම
- අසමාන සේ ඉලක්ක කර ගැනීම සහ ලිංගික සේවකයන් සූරා කෑමේ වැඩි අවධානම මගහරිනු සඳහා ලිංගික වැඩ අපරාධයක් සේ සැලකීම ඉවත් කිරීම
- බහුජාතික සමාගම් ඇතුළත් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සියලු ව්‍යාපාරික ආයතන, ව්‍යාපාර සහ මානව අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශ මූලධර්ම ගරු කරන බව සහතික කිරීම
- තම පීඩාකාරී මානව අයිතිවාසිකම් බලපෑම තමන් ආමන්ත්‍රණය කරන්නේ කෙසේද යන්න හඳුනා ගැනීම, වැළැක්වීම, සමනය කිරීම සහ වගවීම සඳහා ව්‍යාපාරික ආයතන විසින් මානව අයිතිවාසිකම් පිළිබඳ නිසි පරීක්ෂණ ගැන අධ්‍යයනයක් සිදු කළ යුතුය.
- සියලුම සේවකයන්ගේ විශේෂයෙන්ම වතු සේවකයන්ගේ ජීවන තත්වය වැඩි දියුණු කළ යුතුය.
- ශ්‍රී ලංකාවේ වහල් භාවයේ සමකාලීන ආකාරයන්ගේ මූලික හේතුන්ගෙන් එකක් වන වාර්ගික සහ කුලය පදනම් වෙනස් කොට සැලකීම කාර්යක්ෂමව ආමන්ත්‍රණය කිරීම

- සිවිල් සමාජ සංවිධාන, වෘත්තීය සමිති සහ සේවකයන් ආණ්ඩුව සමග අදාල ගැටලු සාකච්ඡා කිරීමට සහ ඒකාබද්ධ තීරණ කරා ළඟා වීමට බහුවිධ පාර්ශ්වකරුවන්ගේ සාකච්ඡා මණ්ඩපයක් ස්ථාපනය කිරීම

අවසාන වශයෙන් බලහත්කාර වැඩ සහ නූතන වහල් භාවයේ අනෙකුත් ආකාරයන්ගෙන් සියලුම සේවකයන් ආරක්ෂා කර ගැනීමට නීතිය පමණක් ප්‍රමාණවත් නොවන බව නැවතත් පැවසීමට කැමැත්තෙමි. ඒවා ඵලදායි වීමට නම් ක්‍රියාවෙන් ශක්තිමත්ව, දේශපාලන කැපවීමෙන් සහාය ලබා, අවශ්‍ය කරන ද්‍රව්‍යාත්මක සහ මානව සම්පත්වලින් අනුබලය ලැබිය යුතුය. නීතිය බලාත්මක කිරීම පිළිබඳ මෙම යොමුව කාර්යක්ෂම ආරක්ෂාව සහ වැළැක්වීමේ පියවර සමග බැඳී තිබිය යුතුය.

සියල්ලන් ඇතුළත් කර ගන්නා සමාජයක් නිර්මාණය කිරීමට සහ පවත්වා ගැනීමට සියලු දෙනාට යහපත් වැඩ ලබා ගැනීම තහවුරු කිරීම සහ වහල් භාවයේ සමකාලීන සියලු ආකාරයන් අවසන් කිරීම අත්‍යවශ්‍යයැයි මම විශ්වාස කරමි.

ඔබගේ අවධානය යොමු කිරීම ගැන නැවතත් ස්තුතියි. මෙම දූත මෙහෙය සාර්ථක කිරීමට දායක වූ සියලු පාර්ශ්වකරුවන්ට සහ පුද්ගලයන්ට මගේ කෘතඥතාවය නැවතත් පුද කරමි. මගේ මැන්ඩේට් බලයට අදාල මෙම කරුණු සහ අනෙකුත් ගැටලු ගැන ශ්‍රී ලංකාණ්ඩුව සමග තවදුරටත් සම්බන්ධව සිටීමට අපේක්ෂා කරමි.